# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 සැප්තැම්බර් 30 චක්‍රලේඛය 2020 අංක 09**

## කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ කොවිඩ්-19 වසංගතය නිසා සංචාරක ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම සැලකිල්ලට ගනිමින් සංචාරක ක්ෂේත්‍රය සඳහා 2019 අප්‍රේල් මස සිට ණය සහන යෝජනාක්‍රම ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කර ඇත. දැනට පවතිනා සංචාරක සීමා කිරීම්, ආර්ථික කටයුතුවල සිදුවී ඇති බාධාවන් සහ සංචාරක අමාත්‍යාංශය සහ අනෙකුත් සම්බන්ධිත නියෝජිත ආයතන විසින් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට ගනිමින් කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 වන දින දක්වා තවත් මාස හයක කාලයකට දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත දන්වා සිටී.

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සංචාරක ක්ෂේත්‍රය වෙත ලබාදී ඇති ණය ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම, සහ සංචාරක ක්ෂේත්‍රය යළි නගාසිටුවීම සඳහා සංචාරක අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇති වැඩ පිළිවෙල සැලකීමේ දී ඉහත යෝජනා ක්‍රමය මඟින් බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ ස්ථායීතාවයට අහිතකර බලපෑමක් හෝ අනිසි පීඩනයක් ඇති නොවන බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. මේ අනුව, මෙම චක්‍රලේඛය ඉහත ණය සහන යෝජනා ක්‍රමය සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන වෙතින් එක සමානව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා නිකුත් කරන ලද්දක් වන අතර මෙම චක්‍රලේඛය මගින් ලබාදෙන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන ලෙස ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහන ලබාදීමට බැංකු නොවන මූල්‍ය ආයතන වෙත හැකියාව ඇත.

**1. පොදු කොන්දේසි හා නියමයන්**

**(i) සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්**

(අ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් සහ පහත ආයතන සමඟ ලියාපදිංචිවී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර:

i) සංචාරක අමාත්‍යාංශය

ii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

iii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතායතන

iv) ප්‍රාදේශීය සභා, නගර සභා හෝ මහ නගර සභා වැනි පලාත් පාලන ආයතන (කෙසේ නමුත් මෙම ආයතන එවැනි ව්‍යාපාර ණය සහන ලබාගැනීමේ දී ඉහත i), ii), සහ iii) හි සඳහන් සංචාරක කටයුතු පිළිබඳ ආයතනයන් හා ලියාපදිංචි විය යුතුය.)

v) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

vi) ශ්‍රී ලංකා හෝටල්කරුවන්ගේ සංගමය

(ආ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර වල සේවා නියුක්තිකයන්. මෙහිදී, අදාළ සේවා නියුක්තිකයා ඉහත (අ) හි සඳහන් ආයතනයක ලියාපදිංචි ව්‍යාපාරයක සේවයේ නිරත වීම ප්‍රමාණවත් ලෙස සැලකිය යුතුය.

(ii) 2019 අප්‍රේල් 18 දින හෝ ඉන් පසු දිනක් වන විට සක්‍රිය කාණ්ඩයේ පැවති සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් ණය සහ 2020 මාර්තු 27 වන දින නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය අනුව ප්‍රතිලේඛන ගත කල අක්‍රිය කාණ්ඩයේ ණය පහසුකම් මෙම යෝජනා ක්‍රමය මගින් සහන ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

(iii) ණය සහන කාලය යන්නට 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා තවදුරටත් මාස හයක කාලසීමාවකට මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම අදහස් වේ.

(iv) මෙම ණය සහනය ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2020 ඔක්තෝබර් 25 දින හෝ ඊට පෙර අදාල බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉල්ලීමක් කල යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසුමේ නියමයන් හා කොන්දේසි සකස් කර අවසන් වීමෙන් පසු 2020 නොවැම්බර් 30 දිනට පෙර සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සමඟ නව ගිවිසුමකට එළඹිය යුතුය.

(v) මෙම ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන, එහෙත් තම ණය ආපසු ගෙවීම සඳහා හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් මෙම ණය සහන කාලය දීර්ඝ කිරීමට

අයදුම් නොකොට, සිය ණය පහසුකම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(vi) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අදාළ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සලකා බලා එම ඉල්ලීම් සපුරාලීමට කටයුතු කල යුතු වේ.

(vii) 2020 අංක 03 සහ 2020 අංක 04 දරන විස්තර සටහන්වල සඳහන් වන පරිදි පොලී රහිත කාලීන ණය සඳහා ගෙවිය යුතු වාරිකය (එනම් මීට පෙර ණය සහනය සඳහා එනම් 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා කාලය සඳහා උපචිත පොලිය ) සුදුසුකම් ලැබූ ගනුදෙනුකරුවන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් 2021 අප්‍රේල් 01 දින සිට ආරම්භ කර අයකර ගැනීමේ හැකියාව පවතී.

## 2. ණය සහනයන් හි සැකැස්ම

(i) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ණය සහන කාල සීමාව තුල අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කල යුතුය.

(ii) මෙලෙස පරිවර්තනය කරන ලද ණය යලි අයකර ගැනීම ආරම්භ කිරීම 2021 ජුලි 01 දිනෙන් පසුව සිදු කල යුතුය.

(iii) මෙලෙස පරිවර්තනය කරන ලද ණය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කල වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අය කල හැකි අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(iv) මෙම ණය ආපසු අය කරගැනීමේ අවම කාලය වසර දෙකක් වනු ඇත. කෙසේ නමුත්, ණය ගනුදෙනුකරු විසින් අදාළ ණය ඊට අඩු කාලයක් තුලදී පියවීමට අදහස් කරන්නේ නම් හෝ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ආපසු පියවීමට වසර දෙකට වඩා වැඩි කාලයක් ලබා දීමට සූදානම් අවස්ථාවන් හිදී එවැනි ඉල්ලීම් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පහසුකම් සැලසිය හැක. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොලී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසගත යුතුවේ.

(v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන සක්‍රිය සහ අක්‍රිය ණය සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොළී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුලදී දඩ පොළී එකතුකිරීම හෝ අය කිරීම නොකල යුතුවේ.

**3. වාර්තාකරණ අවශ්‍යතා**

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන යෝජනාක්‍රමය යටතේ ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සෑම මසකම 30 වැනි දින වන විට පවතින තොරතුරු, 2020 දෙසැම්බර් 01 දින සිට සෑම මසකම වැඩ කරන දින 15 තුළ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතුය. මේ පිළිබඳ වාර්තාකරණ ආකෘතියක් ඇමුණුම් I හා II හි දක්වා ඇත.

**4. අවලංගු කිරීම්**

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට සහන සැපයීමේ ක්‍රියාමාර්ග මැයෙන් 2020 ජුලි 16 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 07 දරණ චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**

මුදල් මණ්ඩලයේ සභාපති සහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති